චක්‍රලේඛ අංක: 07/2019


මගේ අංකය
எனது இல
My No.
RG/MBD/ 1-1 චක්‍රලේඛ

ඔබේ අංකය
உமது இல.
Your No.

දුරකථන අංක
தொலைபேசி இல
Telephone Nos.
2889488
2889489

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No
2889491

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail
info@rgd.gov.lk
rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය
இணையத்தளம்
Web site
www.rgd.gov.lk

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No.
565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2019.02. 26

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

**විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විදේශ ලිපිනය සඳහන් කර විවාහ ලේඛන ලියාපදිංචි කිරීම.**

විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ විවාහ වීමට අදහස් කර සිටින පාර්ශවයන් දෙදෙනාගෙන් අයෙක් එකී පනතේ 23 වන වගන්තිය යටතේ ලබාදිය යුතු දැනුම්දීමට කලින් වූ ඒ ළඟම දින 10 ක් දිවයිනේ පදිංචිව නොසිටින අවස්ථාවක දී සහ අනෙක් පාර්ශවය ඒ ළඟම දින 10 ක් දිවයිනේ පදිංචිව සිටින අවස්ථාවක දී එසේ දින 10 ක් දිවයිනේ පදිංචිව සිටින පාර්ශවය විසින් තමන් දින 10 ක් පදිංචිව සිටි ප්‍රදේශයේ රෙජිස්ට්‍රාර් වෙතට විවාහ දැනුම්දීම සිදු කළ හැකි බව එකී පනතේ 23 (3) වන වගන්තියේ ද විවාහ වීමට අදහස් කර සිටින පාර්ශවයන් දෙදෙනාම එකී පනතේ 23 වන වගන්තිය යටතේ ලබාදිය යුතු දැනුම් දීමට කලින් වූ ඒ ළඟම දින 10 ක් දිවයිනේ පදිංචිව නොසිටින අවස්ථාවකදී සහ එක් පාර්ශවයක් ඒ ළඟම දින 4 කට වඩා අඩු නොවන කාලයක් දිවයිනේ පදිංචිව සිටින අවස්ථාවක දී එසේ දින 4 ක් දිවයිනේ පදිංචිව සිටින පාර්ශවය විසින් තමන් දින 4 ක් පදිංචිව සිටි ප්‍රදේශයේ රෙජිස්ට්‍රාර් වෙතට විවාහ දැනුම්දීම සිදුකළ හැකි බවට එකී පනතේ 23(4) වන වගන්තියේ දැක්වේ.

එසේම එකී 23 (3) හා 23(4) වන වගන්ති යටතේ කරනු ලබන දැනුම්දීමේ දී දිවයිනේ පදිංචිව නොසිටින පාර්ශවය වෙනුවෙන් ද පළ කරන ලද දැන්වීමක් ලෙසට සලකනු ලැබිය හැකි බව එකී පනතේ 23 (5) වන වගන්තියෙහි දක්වා ඇත.

ඒ අනුව එවැනි දැන්වීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී පාර්ශවයන් ඉල්ලීමක් කරන්නේ නම්, පනතේ 34 හා 35 වන වගන්ති ප්‍රකාරව විවාහයක් ලියාපදිංචි කරනු ලබන විවාහ ලේඛනයේ (ලියාපදිංචි කිරීම අං 115 ආකෘතිය) පාර්ශවකරුවන්ගේ පදිංචිය දැක්වෙන ස්ථානයේ විදේශ ලිපිනය සඳහන් කිරීමේ නෛතික බාධාවක් නොමැති බව කාරුණිකව දන්වමි.

මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් - 1. නීතිපති - E 82 / 2015 හා E 478 / 2017 යොමුව අනුව දැනගැනීම සඳහා

2. ලේකම් - අභ්‍යන්තර , ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - ඔබගේ දැනගැනීම සඳහා

3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - ඔබගේ දැනගැනීම සඳහා

4. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - ඔබගේ දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා

5. සියලුම ඉඩම් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - ඔබගේ දැනගැනීම සඳහා